නිරවද්‍යභාවය යනු මාධ්‍යකරණයේ තිබිය යුතු මූලික ප්‍රතිපත්තියකි. ඒ නිසාම, සෑමවිටම නිවැරදි නොවන, නොමඟ යවන සුළු හෝ විකෘති කළ තොරතුරු හෝ ඡායාරූප ප්‍රකාශයට පත් නොකිරීමට මාධ්‍ය වග බලා ගත යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන් පවසයි. යම් කිසි පුවතක් හා පළ කරනා ඡායාරූප වෙනත් පාර්ශවයක් ඔස්සේ ලබාගන්නේ නම්, එම ඡායාරූප නිවැරදි ඒවා දැයි බහු මූලාශ්‍ර ඔස්සේ හෝ තහවුරු කරගැනීම අත්‍යවශ්‍ය වේ.

"රෝහල් කවුළුවකින් වැටී රුසියාවේ තෙල් ලොක්කෙක් මරුට" යන සිරස්තලය යටතේ මව්බිම පුවත්පතේ (සැප්.02, 2022) පලවී තිබූ වාර්තාව, වැරදි ඡායාරූප මාධ්‍ය තුළ පළ වන අවස්ථාවන්ට නිදසුනකි. එම පුවත් වාර්තාව හා පළ වී තිබුණේ, හිටපු ජපන් අගමැති ෂින්සෝ අබේ ජූලි 08, 2022 දින වෙඩි පහරට ලක්වූ අවස්ථාවේදී ගත් ඡායාරූපයකි.

පුවතට අදාළ සේයාරූ සොයා ගැනීමේදී, විශ්වාසනීය මූලාශ්‍ර සහ බහු මූලාශ්‍ර පරිශීලනය කළේ නම්, මෙසේ වැරදි ඡායාරූපයක් පළ වීම මඟහරවා ගන්නට තිබුණේ නොවේද?

නිවැරදි මූලාශ්‍ර ඔස්සේ ලබාගත්, පුවතට අදාළ නිවැරදි ඡායාරූප පමණක් පළ කරමු!

මූලාශ්‍ර:
https://www.telegraph.co.uk/.../killing-shinzo-abe-how.../
https://www.globaltimes.cn/page/202207/1270074.shtml?id=11